## මිනුවන්ගොඩ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (කා.සේ. සේ. III) | 01 | PL1/2016 (රා.ප.චා. 03/2016ට අනුව) | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 නමුත් රා.ප.චා.ලේ. 03/2016 අනුව අදාළ මූලික වැටුප හා ඊට අදාළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත. (බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු ය.) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වැනි වසර සමත්ව තිබිය යුතු ය. |
| 02 | සෞඛ්‍ය කම්කරු (කා.සේ. සේ. III) | 01 | PL1/2016 (රා.ප.චා. 03/2016ට අනුව) | රු. 24,250 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 නමුත් රා.ප.චා.ලේ. 03/2016 අනුව අදාළ මූලික වැටුප හා ඊට අදාළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත. (බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි වසර සමත්ව තිබිය යුතු ය. |
| 03 | ආදාහනාගාර ක්‍රියාකරු III කා.සේ.සේ. (අර්ධ ශිල්පීය) | 01 | PL2/2016 (රා.ප.චා.03/2016ට අනුව) | රු. 25,250- 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 නමුත් රා.ප.චා.ලේ. 03/2016 අනුව අදාළ මූලික වැටුප හා ඊට අදාළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත. (බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.) | **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා** *අධ්‍යාපන සුදුසකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතු ය.) *වෘත්තීය සුදුසුකම් :* අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) අවම වශයෙන් දෙවන මට්ටමේ |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | නිපුණතාවයක් ලබාගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු ය.)<br>*පළපුරුද්ද :*<br>අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05ක් සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්, වසර 05ක සතුටුදායක සේවා කාලය සපුරා ඇති සේවකයෙකු විය යුතු ය.<br>**බාහිර අයදුම්කරුවන් සඳහා**<br>*අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06)ක් සමත්වී තිබීම.<br>(මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතු ය.)<br>*වෘත්තීය සුදුසුකම් :*<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතු ය.) |

2. *පොදු සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
4. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස බලපානු නොලැබේ.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

3. *බඳවා ගැනීම හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.)
2. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

4. *බඳවා ගැනීමේ පිළිවෙල :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වැඩ/ක්ෂේත්‍ර කම්කරු :**

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පුරවනු ඇත. |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සෞඛ්‍ය කම්කරු :**

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පුරවනු ඇත. |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ආදහනාගාර ක්‍රියාකරු**

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පුරවනු ඇත. |
| සාමාන්‍ය දැනීම | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*4. සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මිනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*5. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2017.10.04 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම් හා සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි, මිනුවන්ගොඩ නගර සභාව, මිනුවන්ගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තවද අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය. :

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතිකය;
3. ග්‍රාම නිලධාරී සහතිකය;
4. පළපුරුද්ද පිළිබඳ සහතිකය;
5. චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේදී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියළු බලතල මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් හා සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි සතු වේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම් හා සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව,
මිනුවන්ගොඩ.

2017 අගෝස්තු මස 15 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ ..............................තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

1. I. මුලකුරු සමග නම :————————————.
   II. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.
3. ස්ථිර ලිපිනය :————————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.
6. උපන් දිනය : අවුරුද්ද:——————, මාසය:——————, දිනය:——————
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
8. විවාහක/අවිවාහක බව :————————————.
9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද?:————————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————————————.

11. I. වෙනත් සුදුසුකම්:————————————.
    II. වෘත්තිය සුදුසුකම්:————————————.
    III. සේවා පළපුරුද්ද:————————————.

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :________________________.
එම තනතුරට පත් වූ දිනය :________________________.

13. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :________________________.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන්කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

____________________.
අයදුම්කරුගේ අත්සන.

දිනය:________________.